Lesson 7

I am Student

අයෑම් අ ස්ටුඩන්ට්

මම ශිෂ්‍යයයෙක්

පහත වාක්‍යය ටික හොදින් බලන්න

I am Sandaruwan
අයෑම් සඳරුවන්
මම සඳරුවන්.

I am 12 Years old
අයෑම් ට්වෙල් ඉය(ර්)ස් ඕල්ඩ්
මට වයස අවුරුදු 12යි.

I am a student
අයෑම් අ ස්ටුඩන්ට්
මම ශිෂ්‍යයක්.

I am in Grade -7
අයෑම් ඉන් ග්‍රේඩ් සෙවන්
මම ඉන්නේ 7 ශ්‍රේණියේ.

My brother’s name is Dilruwan
මයි බ්‍රද(ර්’)ස් නේම් ඉස් දිල්රුවන්
මගේ සහෝදරයාගේ නම දිල්රුවන්.

He is 10 years old
හී ඉස් ටෙන් ඉය(ර්)ස් ඕල්ඩ්
ඔහුට වයස අවුරුදු 10යි

He is in Grade 5
හී ඉස් ඉන් ග්‍රේඩ් ෆයිව්
ඔහු ඉන්නේ පහ ශ්‍රේණියේ

My sister's name is Shanika
මයි සිස්ට(ර්)'ස් නේම් ඉස් ශානිකා
මගේ සහෝදරියගේ නම ශානිකා.

She is 8 years old
ෂී ඉස් එයිට් ඉය(ර්)ස් ඕල්ඩ්
ඇයට වයස අවුරුදු අටයි.

She is in Grade 3
ෂී ඉස් ඉන් ග්‍රේඩ් ත්‍රී
ඇය ඉන්නේ තුන ශ්‍රේණියේ

We are Children
වී ආ චිල්රන්
අපි ළමයි.

We are Students
වී ආ ස්ටුඩන්ඩ්ස්
අපි ශිෂ්‍යයෝ.

We are clever
වී ආ ක්ලෙව(ර්)
අපි දක්ෂයි.

ඉහත වාක්‍ය වල am, is, are කියන පද තුන ඔබ නිරීක්ෂණය කරන්න ඇති. මෙම පද තුන ඉංග්‍රිසි භාෂාවේ ඉතාම වැදගත් පද තුනක්. ඉංග්‍රීසි භාෂාවෙන් බොහෝ අදහස් ප්‍රකාශ කරන්න මෙම පද තුන අපට ප්‍රයෝජනවත් වෙනවා. නිශ්චිත අර්ථයක් සඳහන් කරන්න බැරි වුණත් ඒවායින් හැඟවෙන්නේ ඉන්නවා, වෙනවා, තියෙනවා, සිටිනවා වැනි තේරුම් කිහිපයක්.

ඉන්නවා , වෙනවා , තියෙනවා , සිටිනවා කියන්නේ බැලූ බැල්මට ක්‍රියා පද. නමුත් am ,is ,are කියන පදවලින් කිසිඳු සැබෑ ක්‍රියාවක් ප්‍රකාශ වෙන්නේ නැහැ. එය කරුණක් වශයෙන් මතක තබා ගන්න.

- ❖ මීලඟට අපි බලමු මේ පද භාවිතා කරන්නේ කොහොමද කියලා.

- Am (ඈම්) - යෙදෙන්නේ I-අයි -මම සමඟ පමණයි.
- Is (ඉස්) - යෙදෙන්නේ ඒක වචන කතෘවරුන් සමඟ.
- Are (ආ) - යෙදෙන්නේ බහු වචන කතෘවරුන් සමඟ.

(වාක්‍යයක කතෘ කියන්නේ වාක්‍යයයේ ප්‍රධානියාට. ඔහු ගැන තමයි වාක්‍යයෙන් කියවෙන්නේ)

මීලඟට අපි බලමු am, is, are භාවිතා කරලා ප්‍රකාශ කරන්න පුළුවන් මොන වගේ අදහස්ද කියලා.

- අපිට පුළුවන් යම් කෙනෙක් හෝ යම් දෙයක් හඳුන්වා දෙන්න

I am Nalaka
අයෑම් නාලක
මම නාලක

This is my brother
දිස් ඉස් මයි බ්‍රද(ර්)
මේ මගේ සහෝදරයා

This is our house
දිස් ඉස් අව(ර්) හවුස්
මේ අපේ ගේ

These are my books
දීස් ආ මයි බුක්ස්
මේ මගේ පොත්

That is our school
දැට් ඉස් අව(ර්) ස්කූල්
අර අපේ ස්කෝලේ

Those children are my friends
දෝස් චිල්ඩ්‍රන් ආ මයි ෆ්‍රෙන්ඩ්ස්
අර ළමයි මගේ යාළුවෝ

{ළඟ තිබෙන එක් දෙයක් ගැන සඳහන් කරද්දී this දිස් - මේ / මෙය යන වචනය භාවිතා කරනවා. එහි බහුවචනාර්ථ පදය these දීස්- මේ / මේවා}

This book - මේ පොත

These books - මේ පොත්

{දුර තිබෙන දෙයක් ගැන සඳහන් කරද්දී that දැට් අර / ඒ - එහි බහුවචනාර්ථ පදය those දෝස් -අරවා /ඒවා}

That book - අර පොත/ ඒ පොත

These books - අර පොත්/ ඒ පොත්

- යමෙකුගේ හෝ යම් දෙයක වයස ප්‍රකාශ කිරීමට

I am 15 now
අයෑම් ෆිෆ්ටීන් නව්
මට දැන් පහළොවයි.

My brother is 13 years old
මයි බ්‍රද(ර්) ඉස් ත(ර්)ටීන් ඉය(ර්)ස් ඕල්ඩ්
මගේ සහෝදරයට වයස අවුරුදු 13 යි

That building is 100 years old
දැට් බිල්ඩින් ඉස් හන්ඩ්‍රඩ් ඉය(ර්)ස් ඕල්ඩ්
අර ගොඩනැගිල්ල අවුරුදු සීයක් පරණයි.

This tv is very old now
දිස් ටීවී ඉස් වෙරි ඕල්ඩ් නව්
මේ ටී වී එක දැන් ගොඩක් පරණයි

- සිටින තැන, තිබෙන තැන ප්‍රකාශ කිරීමට

I am in Grade 3
අයෑම් ඉන් ග්‍රේඩ් ත්‍රී
මම ඉන්නේ තුන ශ්‍රේණියේ.

Mother is in the kitchen
මද(ර්) ඉස් ඉන් ද කිචන්
අම්මා කුස්සියේ.

We are in Kandy
වී ආ ඉන් කැන්ඩි
අපි ඉන්නේ නුවර

It is in the cupboard
ඉට් ඉස් ඉන් ද කබඩ්
ඒක කබඩ් එකේ.

They are in the playground
දේ ආ ඉන් ද ප්ලේ ග්‍රවුන්ඩ්
ඔවුන් පිට්ටනියේ

Your bag is on the table
යුව(ර්) බෑග් ඉස් ඔන් ද ටේබල්
ඔයාගේ බෑග් එක මේසේ උඩ

- ශාරීරික ලක්ෂණ ප්‍රකාශ කිරීමට

He is tall
හී ඉස් ටෝල්
ඔහු උසයි

She is lean
ෂී ඉස් ලීන්
ඇය කෙට්ටුයි

He is very strong
හී ඉස් වෙරි ස්ට්‍රෝං
ඔහු ඉතා ශක්තිමත්

Her sister is very beautiful
හ(ර්) සිස්ට(ර්) ඉස් වෙරි බියුටිෆුල්
ඇගේ සහෝදරිය ඉතාම ලස්සනයි.

- යමෙකුගේ ගතිගුණ ප්‍රකාශ කිරීමට

My mother is very kind
මයි මද(ර්) ඉස් වෙරි කයින්ඩ්
මගේ අම්මා හරිම කරුණාවන්තයි

My father is very generous
මයි ෆාද(ර්) ඉස් වෙරි ජෙනරස්
මගේ තාත්තා හරිම ත්‍යාගශීලියි.

Children are innocent
චිල්රන් ආ ඉනසන්ට්
ළමයි අහිංසකයි

He is lazy
හී ඉස් ලේසි
ඔහු කම්මැලියි

Our principal is very strict
අව(ර්) ප්‍රින්සිපල් ඉස් වෙරි ස්ට්‍රික්ට්
අපේ ප්‍රින්සිපල් හරිම තදයි

She is very punctual
ෂී ඉස් වෙරි පංක්චුවල්
ඇය හරියටම වෙලාවට වැඩ

- හැඟීම්, දැනීම් ආදිය ප්‍රකාශ කිරීමට

I am very hungry now
අයෑම් වෙරි හංග්‍රි නව්
මට දැන් හරි බඩගිනියි.

Teacher is angry
ටීච(ර්) ඉස් ඇංග්‍රි
ටීච(ර්)ට කේන්තියි

She is sad
ෂී ඉස් සෑඩ්
ඇයට දුකයි

We are very tired
වි ආ වෙරි ටය(ර්)ඩ්
අපිට හරිම මහන්සියි.

They are happy
දේ ආ හැපී
ඔවුන්ට සතුටුයි

He is sleepy
හී ඉස් ස්ලීපී
ඔහුට නිදිමතයි

- ද්‍රව්‍ය වල ලක්ෂණ ප්‍රකාශ කිරීමට

This box is very heavy
දිස් බොක්ස් ඉස් වෙරි හෙවි
මේ පෙට්ටිය හරි බරයි.

This is too hot
දිස් ඉස් ටූ හොට්
මේක හරිම උණුසුම්

That house is very large
දැට් හවුස් ඉස් වෙරි ලාජ්
අර ගේ හරි විශාලයි.

Water in this well is very clean
වෝට(ර්) ඉන් දිස් වෙල් ඉස් වෙරි ක්ලීන්
මේ ළිඳේ වතුර හරිම පිරිසිදුයි

- ඊට අමතරව කතෘ සම්බන්ධ ඕනෑම තත්ත්වයක් ප්‍රකාශ කිරීමට,

You are late today
යූ ආ ලේට් ටුඩේ
ඔයා අද පරක්කුයි

My grandmother is retired now
මයි ග්‍රෑන්ඩ් මද(ර්) ඉස් රිටය(ර්)ඩ් නව්
මගේ ආච්චි දැන් විශ්‍රාමිකයි

Our teacher is absent today
අව(ර්) ටීච(ර්) ඉස් ඇබ්සන්ට් ටුඩේ
අද අපේ ටීච(ර්) නැහැ (පැමිණ නැහැ)

She is ill
ෂී ඉස් ඉල්
ඇය අසනීපෙන්

I am busy now
අයෑම් බිසී නව්
මම දැන් කාර්ය බහුලයි

We are ready
වී ආ රෙඩි
අපි ලෑස්තියි

The shop is closed
ද ෂොප් ඉස් ක්ලෝස්ඩ්
සාප්පුව වහලා

He is at home
හී ඉස් ඇට් හෝම්
ඔහු ගෙදර

හොඳයි දැන් ඔබට පැහැදිලි ඇති am, is, are යන පද තුන භාවිතා කරමින් කොතරම් අදහස් ප්‍රමාණයක් ප්‍රකාශ කළ හැකිද යන බව.

ඉන්නවා , වෙනවා , තියෙනවා වගේ තේරුම් එම වචන වල තිබෙනවා .නමුත් ඔබට පෙනේවී ඉහත උදාහරණ කිසිවෙකින් සත්‍ය ක්‍රියාවන් කිසිවක් ප්‍රකාශ වී නැති බව.ඒ කියන්නේ සැබෑවටම කරන දේවල් මේ වචන වලින් ප්‍රකාශ වෙන්නේ නැහැ . ඔබ මතක තබා ගත යුතු කරුණ තමයි සැබෑවටම කරනා ක්‍රියාවන් හැර කතෘ සම්බන්ධ වෙනත් ඕනෑම ප්‍රකාශයක් මෙම පද භාවිතා කරමින් පැවසිය හැකි බව.

මීලඟට අපි බලමු am, is, are වාක්‍යය වල නැතාර්ථය ප්‍රකාශ කරන්නේ කොහොමද කියලා.

- වාක්‍යයක am හෝ is, are පදයට සරල ලෙස not එකතු වීමෙන් එහි නැතාර්ථය ලැබෙනවා.

I am not hungry
අයෑම් නොට් හංග්‍රි
මට බඩගිනි නෑ

He is not at home
හී ඉස් නොට් ඇට් හෝම්
ඔහු ගෙදර නෑ

It is not easy
ඉට් ඉස් නොට් ඊසි
ඒක ලේසි නෑ

We are not tired
වී ආ නොට් ටය(ර්)ඩ්
අපිට මහන්සි නැහැ

Buses are not crowded today
බසස් ආ නොට් ක්‍රවුඩඩ් ටුඩේ
බස් අද සෙනඟ පිරිලා නැහැ

She is not angry
ෂී ඉස් නොට් ඇංග්‍රි
ඇයට කේන්ති නැහැ

මීළඟට am, is, are වාක්‍යය වල ප්‍රශ්නාර්ථය සෑදෙන ආකාරය බලමු

- Am හෝ is හෝ are වාක්‍යයයේ මුලට එනම් කතෘට පෙර යෙදීමෙන් ඒවාගේ ප්‍රශ්නාර්ථ රූපය ලැබෙනවා.

Are you hungry?
ආ යූ හංග්‍රි?
ඔයාට බඩගිනිද?

Is she kind?
ඉස් ෂී කයින්ඩ්?
ඇය කාරුණිකද?

Is he at home ?
ඉස් හී ඇට් හෝම් ?
ඔහු ගෙදර ඉන්නවද ?

Is it difficult?
ඉස් ඉට් ඩිෆිකල්ට්?
ඒක අමාරුද?

Are they ready?
ආ දේ රෙඩි?
ඔවුන් ලෑස්තිද?

Are they tired ?
ආ දේ ටය(ර්)ඩ් ?
ඔවුන්ට මහන්සිද ?

දැන් ඔබට පහසුවෙන්ම පහත අභ්‍යාසය කළ හැකියි. වාක්‍යය තැනීමේදී අවශ්‍ය වන වචන වරහන් තුල දී තිබෙනවා. ඔබ කළ යුත්තේ ඒවා යොදා ගනිමින් am, is, are නිසි පරිදි යොදා වාක්‍යය තැනීමයි. නැතාර්ථයේ වාක්‍යය වලට ඔබ විසින් not යෙදිය යුතුයි. පළවෙනි වාක්‍යය ඔබ වෙනුවෙන් සාදා දී තිබෙනවා. අභ්‍යාසය කර අවසන් වූ පසු මෙම පොත අවසානයේ ඇති අභ්‍යාස වලට පිළිතුරු කොටසේ එක් එක් අභ්‍යාසය සඳහා දී ඇති පිළිතුරු සමඟ ගලපා ඒවායේ හරි වැරදි බැලිය හැකියි. පහත අභ්‍යාස වල ඔබ නොදන්නා වචනයක් හමු වුවහොත් පාඩම අවසානයේ ඇති වචන මාලාව බලා එම වචනයේ තේරුම දැන ගත හැකියි.

Ex:- 05

01. මේ පොත හරිම ප්‍රයෝජනවත්

[very, useful, book, this]

This book is very useful

02. මේක අළුත් එකක්

[new, one, a, this]

03. මගේ දෙමව්පියෝ කාර්යබහුලයි මේ දවස්වල

[these days, busy, my parents]

04. ඇය හරිම මිත්‍රශීලි ගෑණු ළමයෙක්

[very, friendly, girl, she, a]

05. මගේ කාමරය හරිම අපිළිවෙලයි

[untidy, very, my room]

06. අද සාප්පු ඇරලා නැහැ

[shops, open, today]

07. දොර ලොක් කරලා නැහැ

[the door, locked]

08. මේ මදි (ප්‍රමාණවත් නැහැ)

[enough, this]

09. මේක මගේ නෙමෙයි

[mine, this]

10. මේක අපේ වැඩේට සුදුසු නැහැ

[suitable, for our work, this]

11. ඔයා මා එක්ක තරහද?

[angry, you, with me]

12. විභාගේ ලේසිද?

[easy, the exam]

13. දොර ලොක් කරලාද?

[locked, the door]

14. දැන් ඔයාට මහන්සිද?

[tired, you, now]

15. මේක ඔයාගෙද?

[this, yours]

16. අද ඔහු ගෙදරද ?

[at home ,today ,he]

Lesson 7

Spoken English

කාව හරි මුණ ගැහුණම එයාට greet කරන්න පුළුවන් තව විදියක් තමයි එයාට කොහොමද කියල අහන එක . මේක ඉංග්‍රීසි කතා බහේ හරි සුලබයි. අපි බලමු ඉංග්‍රීසියෙන් "ඔබට කොහොමද ?"කියලා අහන හැටි

How are you ? - හව් ආ යූ ? - ඔයාට කොහොමද ?

මෙහි පහත සදහන් උදාහරණ දෙබස් වලදී ප්‍රශ්නය අසන විදිය මෙන්ම එයට පිළිතුරු දෙන විදියත් ඔබට ඉගෙන ගන්න පුළුවන් .

Dialogue 1

A : Hi , How are you ?
හායි , හව් ආ යූ ?
හායි , ඔයාට කොහොමද ?

B : Hey , I am fine . How are you ?
හේ , අයෑම් ෆයින් .හව් ආ යූ ?
හේ , මම හොදින් . ඔයාට කොහොමද ?

Dialogue 2

A: Hello , Good morning . How are you ?
හෙලෝ , ගුඩ් මෝනින් . හව් ආ යූ ?
හෙලෝ , සුබ උදෑසනක් . ඔයාට කොහොමද ?

B: Hello , I am good . How are you ?
හෙලෝ , අයෑම් ගුඩ් . හව් ආ යූ ?
හෙලෝ , මම හොදින් . ඔයාට කොහොමද ?

මෙවැනි පැනයකට යමෙකු මේ විදියට කෙටියෙන් පිළිතුරු දෙන්නත් ඉඩ තියෙනවා

Dialogue 3

A : Hello , How are you ?
හෙලෝ , හව් ආ යූ ?
හෙලෝ , ඔයාට කොහොමද ?

B: Fine , and you ?
ෆයින් , ඇන්ඩ් යූ ?
හොඳයි , ඔයාට ?

පහත දෙබසේ තියෙන්නේ ඔයාට කොහොමද කියන ප්‍රශ්නය ඇහුවාම එයට ඉතාම ආචාරශීලීව පිළිතුරු දිය හැකි ක්‍රමයක්.

- I am Fine , Thanks , How are you ?

බොහෝවිට යාලුවෙක් හෝ නිතර හමුවන කෙනෙක් නොවන ,තරමක් ආචාරශීලී බව දැක්විය යුතු කෙනෙක් ඔබෙන් ඇසුවොත් How are you ? කියල ඔබට මේ විදියට උත්තර දෙන්න පුළුවන්

Dialogue 4

A : Hello , How are you ?
හෙලෝ , හව් ආ යූ ?
හලෝ , කොහොමද ඔයාට ?

B: I am Fine , Thanks , How are you ?
අයෑම් ෆයින් , තෑංක්ස් ,හව් ආ යූ ?
මම හොඳින් , ස්තූතියි , ඔයාට කොහොමද ?

එයම තරමක් කෙටියෙන් අසන්නත් පුළුවන් පහත පරිදි කලින්, දෙබසට වඩා තරමක් මිත්‍රශීලී කෙනෙකුගෙන් අසනවා නම්

Dialogue 5

A: Hi Rithu , How are you?
හායි රිතූ , හව් ආ යූ ?
හායි රිතූ , ඔයාට කොහොමද ?

B: I'm fine, Thanks . And you?
අයෑම් ෆයින් , තෑන්ක් යූ , ඇන්ඩ් යූ ?
මම හොඳින් . ස්තූතියි , ඔයාට ?

ඒ සංවාදය මේ විදියට වෙන්නත් පුළුවන්

Dialogue 6

A: Hello, how are you?
හෙලෝ , හව් ආ යූ ?
හෙලෝ , ඔයාට කොහොමද ?

B: I'm fine, thanks. How about you?
අයෑම් ෆයින් , තෑන්ක්ස් , හව් අබවුට් යූ ?
මම හොදින් , ස්තුතියි , ඔයාට කොහොමද ?

පෙරලා "ඔබට කොහොමද ?" කියලා අසද්දී "How are you ?" වෙනුවට "How about you ?" කියලා අහන්න පුළුවන්. " ඔබ ගැන කොහොමද ?" කියන අදහස ඉන් ලැබෙන්නේ

How are you ? කියන ප්‍රශ්නෙට උත්තර දිය හැකි තවත් විධි සහ ඒ ප්‍රශ්නය ඇසිය හැකි තවත් විධි අපි ඊලග පාඩම් කිහිපයේදී ඉගෙන ගනිමු. එතෙක් දැනට අපි ඉගෙන ගත දේවල් නැවත බලමින් හොදින් මතක තබා ගන්න

Vocabulary 7

Student – ස්ටුඩන්ඩ් – ශිෂ්‍යයා
Clever – ක්ලෙව(ර්) – දක්ෂ
House – හවුස් – ගෙය
Building – බිල්ඩිං – ගොඩනැගිල්ල
Year – ඉය(ර්) – වසර

Brother – බ්‍රද(ර්) – සහෝදරයා
Kitchen – කිචන් – කුස්සිය
Cupboard – කබඩ් – කබඩ් එක
Tall – ටෝල් – උස
Lean – ලීන් – කෙට්ටු

Strong – ස්ට්‍රෝං – ශක්තිමත්
Generous – ජෙනරස් – ත්‍යාගශීලී
Innocent – ඉනසන්ට් – අහිංසකයි
Hungry – හංග්‍රි – බඩගිනියි
Tired – ටය(ර්)ඩ් – මහන්සි

Angry – ඇංග්‍රි – කේන්තියි
Happy – හැපී – සතුටු
Heavy – හෙවි – බර
Large – ලාජ් – විශාල
Hot – හොට් – උණුසුම්

Grandmother – ග්‍රෑන්ඩ් මද(ර්) – ආච්චි
Retired – රිටය(ර්)ඩ් – විශ්‍රාමික
Absent – ඇබ්සන්ට් – පැමිණ නැති

Ill – ඉල් – අසනීප
Expensive – එක්ස්පෙන්සිව් – මිල අධික

Dark – ඩාක් – අඳුරු
Easy – ඊසි – ලේසි
Crowded – ක්‍රව්ඩඩ් – සෙනග අධික
Difficult – ඩිෆිකල්ට් – අමාරු
Ready – රෙඩි – සූදානම්

Useful – යූස්ෆුල් – ප්‍රයෝජනවත්
Locked – ලොක්ඩ් – අගුලු දැමූ
Open – ඕපන් – විවෘත
Exam – එග්සෑම් – විභාගය
Suitable – සූටබල් – සුදුසු

Absent – ඇබ්සන්ට් – පැමිණ නැති
Friendly – ෆ්‍රෙන්ඩ්ලි – මිත්‍රශීලී
Sleepy – ස්ලීපි – නිදිමත
Strict – ස්ට්‍රික්ට් – තද (විනය ගැන)
Punctual – පංක්චුවල් – වෙලාවට වැඩ කරන

Principal – ප්‍රින්සිපල් – විදුහල්පති
Clean – ක්ලීන් – පිරිසිදු
Closed – ක්ලෝස්ඩ් – වසා ඇති
Tidy – ටයිඩි – පිළිවෙලට ඇති
Untidy – අන්ටයිඩි – අපිළිවෙලට ඇති